**IPRC/16/243**

# දිළිඳු බව නැති කිරීම සඳහා බෞද්ධ මාර්ගෝපදේශයන්ගේ උපයෝගිතාව පිළිබඳ අධ්‍යයනයක්

ආර්. එම්. සී. පී. රත්නායක[1*]

දිළිඳු බව වත්මන් ලෝකය අභිමුව ඇති බලවත් සමාජ, ආර්ථික ප්‍රශ්නයකි. අසංවර්ධිත රටවල පමණක් නොව ඇතැම් සංවර්ධිත රාජ්‍යයන් තුළ ද දිළින්දෝ සිය ගණනක් වෙසෙති. ස්වභාවික සම්පත් ඉහළ, තාක්ෂණ ඥානයෙන් දියුණු රටවල පවා වස්ත්‍ර හිඟ, දුෂ්පෝෂණයෙන් පෙළෙන, නිවාස අහිමි ජනතාව ලක්ෂ ගණනක් ජීවත් වෙති. දිළිඳු බව විෂම ආර්ථිකයේ ප්‍රතිඵලයකි. ඇතැමුන් දිළින්දන් බවට පත් වන්නේ ඔවුන්ගේ විෂම චර්යා රටාව නිසා ය. නූතන අර්ථ ශාස්ත්‍රඥයන් දිළිඳු බව පිළිබඳ වරද පටවන්නේ දිළින්දන් මත වුව ද දිළිඳු බව ඇතිවීම සඳහා පාදක වන ප්‍රස්තුත කිහිපයකි. දුර්වල රාජ්‍ය ප්‍රතිපත්ති, අත්තනෝමතික පාලනය, විරැකියාව, සමාජ ඵලය සාධාරණ ලෙස බෙදී නොයෑම, බදු ප්‍රතිපත්තිය, ජනගහන ගැටලු ආදිය මේ සඳහා බලපායි. දිළිඳු බව නිසා සමාජ ප්‍රශ්න රාශියක් උද්ගත වන අතර ඇතැමෙක් සොරකමට පෙළඹෙති. ඉන් නොනවතින මිනිසා මනුෂ්‍යය ඝාතන, ගණිකා වෘත්තිය, අවි ආයුධ නිෂ්පාදනය ආදි භයානක කායික මෙන් ම මානසික දුරාචාර කෙරෙහි ද යොමු වෙයි. සමාජයේ සෑම තැන්හි ම දිළිඳු බව පැතිර පවතී නම් එය ප්‍රහීණ කිරීමට රාජ්‍යය මඟින් නිසි සැලසුම් සංවිධානය කළ යුතු ය.

ආර්ථික උද්ධමනයෙන් පිඩා විඳින රටක බදු අය නොකළ යුතු ය. නිර්ධනයින්ට ධනය ලැබෙන මාර්ග සැලසිය යුතු ය. එසේ ම ස්වකීය අභිමතාර්ථය පරිදි පාලකයා පාලනය සිදු නොකර ධාර්මික පාලනයක් ගෙන යා යුතු ය. වෘත්තීන්හි නියැළී සිටින්නවුන්ගේ ශක්ති ප්‍රමාණය අනුව සුදුස්සන් පත් කිරීම ද සිදුකළ යුතු ය. දිළිඳු බව පිළිබඳව මෑතකාලීනව අවධානය යොමු කළ දේශපාලන දාර්ශනිකයා වූයේ කාල් මාර්ක්ස් ය. නමුත් මෙම ප්‍රශ්නය කෙරෙහි මීට වසර දහස් ගණනකට පෙර අවධානය යොමු කළ එක ම ශාස්තෘවරයා වූයේ බුදුරජාණන් වහන්සේ ය. සමාජ ආර්ථික ප්‍රශ්න විසඳීමට දියත් කළයුතු සැලසුම් රාශියක් බෞද්ධ සූත්‍ර දේශනාවන්හි අන්තර්ගත වේ. ආර්ථික දේහයේ මූලික ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි ම අවධානය යොමු කර ඇති එම බෞද්ධ උපදේශයන් මඟින් දිළිඳු බව තුරන් කළ හැක්කේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් සිදුකෙරේ.

[1] රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව * prasanthirathnayaka@gmail.com